**නුවරඑළිය දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 22 - 2023**

**-------------------------------------------------------------------------**

**1. විගණන මතය**

**1.1** නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22 ක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශ සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22 කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 22 හි කාරක සභා 21 කට තත්ත්වාගණනය කළ මතයක්ද සහ එක් කාරක සභාවක මතය ව්‍යාවනය කිරීම ද සිදු කර ඇති අතර, තත්ත්වාගණනය කළ මතයන් හා මතය වියාවනය කිරීම සඳහා හේතුවී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 03 ක ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව ස්ථාවර වත්කම් වල පිරිවැය, වර්ෂයේ එකතු කිරීම්, බැහැර කිරීම, වාර්ෂික ක්ෂය සහ සමුච්චිත ක්ෂය ප්‍රතිපාදන සහ ශුද්ධ අගය වෙන් වෙන්ව දැක්වෙන පරිදි උපලේඛන මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | 2024 වර්ෂයේ දී සකස් කිරීමට කටයුතු කරන බව. | ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 04 ක සමාලෝචිත වර්ෂයේ අක්කර බදු ආදායම උපචිත පදනම මත ගිණුම් ගතකර නොතිබුණි. | ඉදිරි ගිණුම් වාර්තා නිවැරදිව සකස් කිරීමට කටයුතු කරන බව. | ආදායම් උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතුය. |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 15 ක, කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.931,500 ක්, නුවරඑළිය ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලයට ලබාදී තිබුණද, එම උපකරණ | අදාල උපකරණ 2024 වර්ෂයේදී ලැබී ඇති බව. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ අත්තිකාරම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කාරක සභාවට ලැබී නොතිබියදී එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | | |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 10 ක, සමාලෝචිත වර්ෂයට අදාල නොවන වියදම්, සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම නිසා අතිරික්තය රු.119,735 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී ගැලපීම් සිදු කිරීමට කටයුතු කරන බව. | ගිණුම් කාලපරිච්ඡේදට අදාල වියදම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 06 ක, සමාලෝචිත වර්ෂයට අදාල වියදම් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා, අතිරික්තය රු.284,468 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී ගැලපීම් සිදු කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඈ) | කාරක සභා 05 ක, සමාලෝචිත වර්ෂයට අදාල ආදායම අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ අතිරික්තය රු.323,181 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී ගැලපීම් සිදු කිරීමට කටයුතු කරන බව. | ගිණුම් කාලපරිච්ඡේදට අදාල ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | කාරක සභා 05 ක, සමාලෝචිත වර්ෂයේ ආදායම වැඩියෙන් ගිණුම්ගත කිරීම නිසා අතිරික්තය රු.127,576 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී ගැලපීම් සිදු කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඊ) | කරල්ලියද්ද හා ගිණිගත්හේන ගොවිජන සේවා කාරක සභාවල සමාලෝචිත වර්ෂයට අදාල ගොවිජන බැංකු ලාභාංශ එකතුව රු.269,620 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී ගැලපීම් සිදු කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (උ) | ගොවිජන බැංකු 05 ක කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,116,680 ක් නුවරඑළිය ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලයට ලබාදී තිබුණද, එම උපකරණ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ගොවිජන බැංකුවට ලැබී නොතිබුණු බැවින්, එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් ලෙස දැක්විය යුතු වුවද, එම ශේෂය ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ දැක්විය යුතුය. |

**1.3.3 අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොවිජන සේවා කාරක සභා 03 ක 1996-1999 කාලපරිච්ඡේදයේ සිට පැවත එන එකතුව රු.556,961 ක හර අවිනිශ්චිත ශේෂ නිරවුල් කර නොතිබුණි. | දීර්ඝ කාලයක සිට පැවත එන ශේෂ බැවින් නිරවුල් කිරීම සඳහා විස්තර සොයා ගත නොහැකි බව. | ශේෂ හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |

**1.3.4 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොවිජන සේවා කාරක සභා 21 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු.30,598,818 ක වත්කම් ශේෂ 110 ක හා එකතුව 18,658,565 ක වගකීම් ශේෂ 63 ක අදාල ස්ථාවර වත්කම් ලේඛන, උප ලේඛන, ශේෂ සනාථ කිරීම්, කාල විශ්ලේෂණ, බැංකු පාස්පොත් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදි සතුටුදායක ලෙස සත්‍යාපණය කිරීමට නොහැකි විය. | අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | වත්කම් හා වගකීම් සනාථ, කිරීම සඳහා අදාල සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.4. නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 56 (1) ඡේදය | ගොවිජන සේවා කාරක සභා 05 ක සමාලෝචිත වර්ෂයට අදාල රු.72,694 ක අක්කර බදු ආදායම් මාර්තු මස 31 දින හෝ ඊට පෙර අයකර නොතිබුණි. | හිඟ ශේෂ ඉදිරි වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 22 ක වාර්ෂික කාර්යසාධන වාර්ථා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු. රෙ. 110 | ගොවිජන සේවා කාරක සභා 16 ක හානි හා පාඩු සම්බන්ධයෙන් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. | ලේඛන සකස් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| | (ii) මු.රෙ. 384.2 | ගොවිජන සේවා කාරක සභා 03 ක චෙක්පත් "ගණුදෙනු කළ නොහැක" ලෙස රේඛනය නොකර විවෘත චෙක්පත් භාවිතා කර තිබුණි. | ඉදිරියේදි උපදෙස් පරිදි කටයුතු කරන බව | - එම - |
| | (iii) මු.රෙ. 880 හා 2020 ජුනි 25 දිනැති අංක 08/2020 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය. | ගොවිජන සේවා කාරක සභා 13 ක අදාල නිලධාරීන් ඇප තැන්පත් කර නොතිබුණි. | ඉදිරියේදී ඇප තැන්පත් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි විධිවිධාන හා චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන ගොවිජන සේවා කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 21.2 ඡේදය | තොග පොත් අඩු වශයෙන් දෙසතියකට වරක්වත් විධායක ලේකම්වරයා විසින් පරීක්ෂා කර ශේෂ නිවැරදි බවට සහතික කල යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 10 ක ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2014 අගෝස්තු 22 දිනැති අංක 07/2014 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | කාරක සභාවක දෛනික රඳවාගත හැකි අතැති මුදල් සීමාව ඉක්මවා අවස්ථා 388 කදී රු.10,299 සිට රු.2,648,433 දක්වා අතැති මුදල් රඳවාගෙන තිබුණි. | සීමාවේ රැඳී සිටීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2000 ජුනි 06 දිනැති අංක 518/2000 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | කාරක සභා 21 හි ගොවිජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර නොතිබුණි. | අදාල උපදෙස් ලබාදී නොතිබුණු බව. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2022 දෙසැම්බර් 13 දිනැති අංක 04/2012 (සංශෝධන VII) දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | දෛනිකව අත රඳවා ගත හැකි රු.50,000 සීමාව ඉක්මවා ගොවිජන සේවා කාරක සභා 08 ක අවස්ථා 310 කදී රු.51,172 සිට රු.651,043 දක්වා මුදල් අත රඳවා ගෙන තිබුණි. | ඉදිරියේදී සීමාව නොඉක්මවීමට අදාල නිලධාරීන් දැනුවත් කළ බව | - එම - |
| (ඌ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය 3.4.2 ඡේදය | කෘෂි කාර්මික ණය පියවීමේ උපරිම කාලය මාස 06 ක් වුවද, ගොවිජන සේවා කාරක සභා 21 ක ගොවීන් 2,137 දෙනෙකුට 1998 මහ කන්නයේ සිට 2023 යල කන්නය දක්වා කාලය තුල නිකුත් කළ එකතුව රු.33,824,681 ක කෘෂි ණය අයකර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව | - එම - |
| (එ) | 2018 මැයි 31 දිනැති අංක 12/2018 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | වටිනාකම රු.50,000 ට වැඩි ගෙවීම් සිදු කිරීමේදී ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්ගේ අනු අත්සන තැබිය යුතු වුවද, හඟුරන්කෙත ගොවිජන සේවා කාරක සභාව මඟින් අවස්ථා 03 කදී රු.200,000 - රු.884,410 දක්වා ගෙවීම් සිදු කිරීමේදී එසේ අනු අත්සන ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව | - එම - |
| (ඒ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 15 ක ස්ථාවර වත්කම් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | - එම - |
| (ඔ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 හා 2009 ජුනි 17 දිනැති අංක 09/2009(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | ගොවිජන සේවා කාරක සභා 11 ක නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | ඇඟිලි සළකුණු යන්ත්‍ර අළුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඕ) | 2018 මැයි 31 දිනැති අංක 12/2018 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | රු.50,000 ඉක්මවන සෑම ගෙවීමක් සඳහාම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්ගේ අනු අත්සන ලබාගත යුතු වුවද, මුංවත්ත හා | ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව | - එම - |

විදුලිපුර ගොවිජන සේවා කාරක සභා විසින් එකතුව රු.4,581,790 ක ගෙවීම් සිදු කළ වවුචර් 06 ක් සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 13 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ, එකතුව රු.3,518,267 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපී කාරක සභා 13 හි ඉකුත් වර්ෂයේ රු.2,690,858 ක අතිරික්තයක් විය. ගොවිජන සේවා කාරක සභා 09 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ එකතුව රු.956,366 ක ඌණතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපී කාරක සභා 06 ක ඉකුත් වර්ෂයේ රු.2,493,184 ක අතිරික්තයක් ද කාරක සභා 03 ක මූල්‍ය ප්‍රතිඵලයේ එකතුව රු.165,569 ක ඌණතාවයක් ද විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති ගොවි බැංකු 21 හි මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තය රු.8,228,658 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.5,401,401 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොවිජන සේවා කාරක සභා 11 ක් විසින් ජංගම ගිණුම්වලට අදාල චෙක් පොත්වල හිස් චෙක්පත් 20 ක් අත්සන පමණක් යොදා කාර්යාලයේ රඳවා ගෙන තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය අක්‍රමිකතාවයක් සිදුවීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය. | චෙක්පත් අත්සන් කිරීමේ බලය ලබාදී ඇති නිලධාරීන් පෞද්ගලික අවශ්‍යතාවයන් මත ප්‍රදේශයෙන් බැහැරව සිටි බැවින් චෙක්පත් අත්සන් යොදා ලබාගෙන තිබුණු බව. | මූල්‍ය පාලනය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නිල්දණ්ඩාහින්න ගොවිජන සේවා කාරක සභාව මඟින් 2022 සැප්තැම්බර් 23 වන දින කිලෝ ග්‍රෑම් 01 ක් රු.310 බැගින් මිලදී ගෙන තිබුණු එළවළු පොහොර කිලෝ ග්‍රෑම් 2102 ක් සමාලෝචිත වර්ෂයේදී රු.204 බැගින් විකිණීම හේතුවෙන් කිලෝ ග්‍රෑම් 01 කින් රු.106 බැගින් එකතුව රු.222,812 ක අලාභයක් සිදුවී තිබුණි. | මෙම පොහොරවල වෙළඳ පොල මිල අඩුවීම හේතුවෙන් මිල ගණන් සංශෝධනය කර දෙන ලෙස අදාල නියෝජිත ආයතනයට දැනුම් දුන් නමුත්, එම ආයතනයෙන් මිල අඩුකිරීමක් සිදු නොකළ බව. | ඵලදායී ආර්ථික තීරණ ගෙන අලාභ අවම කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 17 ක් පරිහරණය කරන ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය කාරක සභා සභා වෙත පවරාගෙන නොතිබුණි. | පවරා ගැනීම් සිදු කර ගැනීමට ඉදිරියේදි කටයුතු කරන බව | වත්කම්වල අයිතිය පවරාගත යුතුය. |
| (ආ) | නුවරඑළිය ගොවිජන සේවා කාරක සභාව භාවිතා කරන නුවරඑළිය මධ්‍යම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර දෙකක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඒ සඳහා ගෙවිය යුතු වරිපනම් බදු රු.316,584 ක් නිරවුල් කර නොතිබුණි. | වාරික වශයෙන් ගෙවීමට සාකච්ඡා කරන ලද බව. | හිඟ වරිපණම් බදු ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 02 කට අයත් වසම් 03 ක කුඹුරු ඉඩම් පර්චස් 23.5 ක් අනවසරයෙන් ගොඩකර ඉදිකිරීම් සිදුකර තිබුණද, ඒ සම්බන්ධයෙන් අදාල නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නීතිමය කටයුතු සිදු කිරීමට පියවර ගන්නා බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව නීතිමය ක්‍රියාමාර්ග සඳහා යොමු විය යුතුය. |
| (ඈ) | ලිඳුල ගොවිජන සේවා කාරක සභාවට අයත් අළුතින් ඉදිකළ වර්ග අඩි 300 ක පමණ ගබඩාව තුල පෞද්ගලික සමාගමකට අයත් පොහොර මිටි 420 ක පමණ ප්‍රමාණයක් ගබඩාකර පැවති අතර, ඒ සඳහා විධිමත් ලිඛිත ගිවිසුමක් හෝ දිස්ත්‍රික් කාර්යාලය මඟින් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. 2024 මාර්තු මාසයේ සිට විගණිත දිනය වූ 2024 අගෝස්තු 09 දක්වා මාස 05 ක පමණ කාලයක් ඉහත සමාගමට මෙම ගබඩාව ලබාදී තිබුණ අතර, එම සමාගම විසින් ගබඩාව භාවිතා කළ කාලයට අදාලව කිසිදු ගාස්තුවක් ගොවිජන සේවා කාරක සභාව විසින් ලබාගෙන නොතිබුණි. | නොතාරිස්වරයෙක් ඉදිරියේ ගිවිසුමක් අත්සන් කර ඉදිරියේදි බදු ගිවිසුමක් මත ලබාදීමට කටයුතු යොදා හිඟ කුලී අයකර ගැනිමට කටයුතු කරන බව. | වත්කම් කළමනාකරණය විධිමත් පරිදි කළ යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුංවත්ත ගොවිජන සේවා කාරක සභාව විසින් 2015 – 2023 අතර කාලය තුල මිලදී ගෙන තිබුණු රු.367,010 ක කෘෂි උපකරණ මිල ගණන් වෙනස්වීම හා යල් පැනීම හේතුවෙන් අලෙවි නොකර රඳවාගෙන තිබුණ අතර 2024 ජූලි 31 වන විට රු.102,000 ක් පමණක් ආවරණය කරගෙන තිබුණි. | අදාල සමාගම් සමඟ සාකච්ඡා කරමින් පවතින බව | නියමිත කාලය තුල උපකරණ විකිණීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 09 ක විකුණා මුදල් ගෙවීමේ පදනම යටතේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් 41 දෙනෙකුගෙන් 2021 – 2022 අතර කාලය තුල අයවිය යුතු මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,795,587 ක් අයකර ගෙන නොතිබුණි. | අදාල නිලධාරීන් දැනුවත් කර ඇති බව. | සියළු හිඟ මුදල් අයකර ගත යුතුය. |
| (ඇ) | දිර්ඝ කාලයක සිට පැවත එන එකතුව 14,410,322 ක වත්කම් ශේෂ 156 ක් සහ එකතුව රු.13,876,915 ක බැරකම් ශේෂ 187 ක් ගොවිජන සේවා කාරක සභා 21 ක, 2018 දෙසැම්බර් 31 දිනැති අංක 07/05/12/ගි.වා/තා.ගො දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ ලිපිය අනුව කටයුතු කර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | කළමනාකරණ උපදෙස් අනුව කටයුතු කර නිරවුල් කර ගැනීම් කළ යුතුය. |

## 3.5 දූෂ්‍ය අක්‍රමිකතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | නුවරඑළිය ගොවිජන සේවා කාරක සභාවේ හා ගොවිජන බැංකුවේ පහත මුල්‍ය අක්‍රමිකතා සිදුව තිබුණි. | | |
| (අ) | ගොවිජන බැංකුවට අයත් රු.2,213,000 කට ආසන්න මුදලක් අයථා පරිහරණය කිරීම, කූට ලේඛණ සකස් කිරීම සහ අධිකාරි බලය ඉක්මවා ගෙවීම් සිදු කිරීම යන චෝදනා හේතුවෙන් 2021 ජනවාරි 12 දින සිට ගොවි බැංකුවට අනුයුක්ත කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරයාගේ වැඩ තහනම් කර තිබුණි. නමුත් මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් මුදල් රෙගුලාසි 104 අනුව පරීක්ෂණයක් සිදුකර | පරීක්ෂණයක් සිදුවෙමින් පවතින බව. | විධිමත් පරිදි පරීක්ෂණ පවත්වා මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. මුදල් රෙගුලාසි 119 හි සඳහන් විධිවිධානයන්ට පටහැනිව දිස්ත්‍රික් කාර්යාලය මඟින් එම නිලධාරියාගේ මාසික වැටුපෙන් රු.28,000 බැගින් රු.314,000 ක් අයකර ගෙන තිබුණ අතර, එම මුදල ගොවිජන බැංකුවට ලබාදිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. එමෙන්ම අයථා ලෙස පරිහරණය කරන ලද මුදල ලෙස හඳුනාගෙන තිබුණු රු.2,213,000ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | | |
| (ආ) | කාරක සභාව සතුව පැවති රු.73,165 ක පොහොර තොගය, රු.5,319 ක කෘෂි උපකරණ තොගය, රු.30,000 ක ප්ලාස්ටික් කුඩ 20 ක් සහ රු.65,000 ක බිම් තරාදියක් අස්ථානගත වී තිබුණද, ඒ සම්බන්ධව පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. | දිස්ත්‍රික් කාර්යාලය දැනුවත් කර ඇති බව. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභාව සතුව තිබුණ උප පත්‍රිකා පොත් 03 ක් 2021 ජූනි මස 14 දින අස්ථානගතවී ඇති බවට මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර නිලධාරිනිය විසින් 2021 ජූනි 17 දින ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙත ලිපියක් මඟින් දැනුම් දී තිබුණු අතර, අස්ථානගතවූ රිසිට් පොත් මඟින් එකතු කර තිබුණ මුදල රු.1,437,903 ක් විය. මේ සම්බන්ධව වගකිවයුතු පාර්ශව හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පරීක්ෂණයක් සිදුවෙමින් පවතින බව. | වගකිව යුතු පාර්ශව හඳුනා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ගයගත යුතුය. යුතුය. |

**3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 03 ක කාබනික පොහොර නිෂ්පාදනය සඳහා 2021 වර්ෂයේදී රු.330,000 ක් ගෙවා මිලදී ගත් "ගොවි මිතුරා" මල්ටි චොපර් යන්ත්‍ර 02ක් හා පරිත්‍යාග ලෙස ලැබී තිබුණු එක් යන්ත්‍රයක් නිෂ්කාර්යයව පැවතුණි. | කාබනික පොහොර නිෂ්පාදනය නොකරන බැවින් භාවිතයට නොගත් බව | යන්ත්‍ර අරමුණුගත කාර්යයට යොදවා ගත යුතුය. |
| (ආ) | අනුමත ඇස්තමේන්තුවක් හා සැලැස්මක් නොමැතිව හා විධිමත් ගිවිසුමකින් තොරව රු.162,700 ක් වැයකර රූපහ ගොවිජන සේවා කාරක සභා භූමියේ ඉදිකිරීම් ආරම්භ කර අඩක් නිමකර අතහැර දමා තිබුණු වැසිකිළිය වසර 03 ක සිට නිෂ්කාර්යව පැවතුණි. | ඉදිරි කාලය තුළ නිම කරන බව. | සැලසුම් සහගත ක්‍රමවේදයකට ඉදිකිරීම් සිදු කළ යුතුය. |
| (ඇ) | පූඩළුඔය ගොවිජන කාරක සභාව විසින් රු.75,730 ක් වැයකර කුලී පදනම මත ලබාදෙන ගරාජ් ගොඩනැගිල්ල හා බොජුන්හල් ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂයේදී අලුත්වැඩියා කර තිබුණද, නිෂ්කාර්යව පැවතුණි. | ගරාජ ගොඩනැගිල්ල ඉදිරියේදී කුලියට ලබාදෙන අතර, බොජුන්හල් ගොඩනැගිල්ල දිරාපත්වී ඇති බව. | වත්කම් පූර්ණ උපයෝජනය කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන ගොවිජන සේවා කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 30 ඡේදයේ 3 වන වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන කාරක සභා 07 ක නියමිත දිනය ඉක්මවා මාස 01 ත් 04 ත් අතර කාලයක් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂවලදි නියමිත දිනට ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 5. ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නුවරඑළිය ගොවිජන බැංකුවේ 2019 සිට 2023 වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රකාශන සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විගණනයට ඉදිරිපත් නොකෙරිණි. | විමර්ශන කටයුතු සිදුවෙමින් පවතින බව. | මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව සකස් කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 03 ක විශේෂ ව්‍යාපෘති ණය යටතේ 2017 වර්ෂයේ ගොවීන් 03 දෙනෙකුට ලබාදුන් රු.1,500,000 ක ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.1,287,941 ක් අයකර නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | සියළු ණය අයකර ගත යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 04 ක ගොවිජන විනිශ්චය සභා වෙත යොමුකළ ගොවීන් 147 දෙනෙකුගෙන් අයවිය යුතු එකතඅව රු.3,776,448 ක ණය ශේෂයක් අයකර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව | - එම - |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 05 ක ගොවීන් 124 දෙනෙකුගේ රු.1,720,175 ක හිඟ ණය සම්බන්ධයෙන් ගොවිජන විනිශ්චය සභාව විසින් 2021 ජනවාරි සිට 2023 නොවැම්බර් මාසය අතර කාලය තුල තීරණ දැනුම් දෙන ලද සහතික පත්‍ර සඳහා 2024 අගෝස්තු 09 දින වන විටත් නඩු පැවරීමට කටයුතු කර නොතිබුණි. | අධිකරණයට යොමු කිරීමට කටයුතු කරන බව | අධිකරණ ක්‍රියාමාර්ග ගෙන අයකර ගත යුතුය. |
| (ඉ) | අදාළ චවුචරය ණය පාලන කමිටු සභාපති විසින් අනුමත කිරීමෙන් පසු ණය මුදල් නිකුත් කළ යුතු වුවත් තෙරිපැහැ ගොවිජන සේවා කාරක සභාව මඟින් එසේ අනුමත කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය තුල ණය වර්ග දෙකකට අදාළව පුද්ගලයන් 05 දෙනෙකුට රු.230,000 ක ණය මුදල් නිකුත් කර තිබුණි. | අදාල චවුචර්පත් නිවැරදි කිරිමට කටයුතු කරන බව. | විධිමත් පරිදි අනුමත කිරීමෙන් පසු ණය ගෙවීම් කළ යුතුය. |